# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1966/16 - 2016 මැයි මස 10 වැනි අඟහරුවාදා - 2016.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය : IR/22/25/2007

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2009.02.26 දිනැති හා අංක 1590/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2009.02.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හිගුල, ඇක්වලපිටිය, ''සම්පත්" හි පදිංචි ඒ. පී. එච්. ජී. සී. ජයවීර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200, හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.09.28 දිනැති ප්‍රදානය පළකරනු ලැබූ 2015.11.17 දිනැති 1941/12 දරන ගැසට් නිවේදනය අවලංගු කර නව ප්‍රදානය ලෙස 2016.03.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 මැයි මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/22/25/2007

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ඒ. පී. එච්. ජී. සී. ජයවීර,
''සම්පත්" ඇක්වලපිටිය,
හිගුල

ඉල්ලුම්කරු (මියගිය)

නඩු අංකය : ඒ/3274

ආර්. ඒ. රත්නවතී රණසිංහ,
''සම්පත්" ඇක්වලපිටිය,
හිගුල.

ආදේශිත ඉල්ලුම්කාරිය

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

අතර ඇති කාර්මික ආරාවුල සම්බන්ධවයි

**තීන්දුව සහ ප්‍රදානය**

1. ගරු කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය අතාවුද සෙනවිරත්න මැතිතුමා විසින් එතුමාගේ අංක IR/22/25/2007 සහ 2009.02.19 දින දරන ලිපිය මගින් ඉහත කී කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කරන ලදී.

2. එසේම ඉහත කාර්මික ආරාවුලට පවත්නා කාරණය වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2006.01.25 දින සිට 2006.12.02 දින දක්වා වැටුප් රහිතව මාවනැල්ල ඩිපෝ කළමණාකරු වශයෙන් සේවය කල ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතාගේ වැඩ තහනම් කිරීම යුක්ති සහගත වන්නේ ද යන්න හා යුක්ති සහගත නොවන්නේ නම් එම මණ්ඩලය වෙතින් ඔහුට කුමන සහනයක් ලැබිය යුතු ද යන්න පිළිබඳව ද වේ යනුවෙන් එකී ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් විසින් නිකුත් කර ඇති ඔහුගේ අංක IR/22/25/2007 සහ 2009.02.13 දින දරන ලිපියෙන් දක්වා ඇත.

3. මෙම ආරාවුල සම්බන්ධයෙන් දෙපාර්ශ්වය විසින් අදාළ ප්‍රකාශ ගොනු කළ පසු නඩුව විභාගයට ගැනීමට පෙර සමථයක් කළ හැකි දැයි බේරුම්කරණය විසින් විමසූ නමුත් එවැනි සමථයක් ඇති කළ නොහැකි බව පෙනී ගියෙන් නඩුව විභාගයට ගන්නා ලදී.


1 A – G 23424 — 19 (2016/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. මේ අනුව නඩුව ඉල්ලුම්කාර පාර්ශ්වයට ආරම්භ කරන ලෙස බේරුම්කරණය විසින් උපදෙස් දෙනු ලදුව නඩු විභාගය ඉල්ලුම්කරු විසින් ආරම්භ කරමින් ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු පමණක් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේදී A1 සිට A11 දක්වා වූ ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. අනතුරුව වගඋත්තරකාර පාර්ශ්වය නඩුව ආරම්භ කරමින් මාවනැල්ල ඩිපෝවේ ඩිපෝ මාර්ග පරීක්ෂක වැගම්මන පල්ලහාගෙදර කරුණාරත්න සහ එකී ඩිපෝවේ සහකාර කළමණාකාර මුදල් ටී. ආර්. කපිල තෙන්නකෝන් යන අය පමණක් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේ දී R1 සිට R5 දක්වාද, X වශයෙන් විනය ව්‍යවස්ථා මාලාවේ ඡායා පිටපතක්ද, X1 සිට X3 දක්වා වූ ලේඛනද ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

6. මෙම නඩුවේ විභාගය පවත්වාගෙන යන අතරතුර දී 2014.06.22 වන දින ඉල්ලුම්කරු මියගියෙන් ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ වන ආර්. ඒ. රත්නවතී රණසිංහ යන අය මියගිය අයගේ මරණ සහතිකය සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් තමන් මෙම නඩුවට ඉල්ලුම්කරු වෙනුවෙන් ආදේශ කරන ලෙස බේරුම් කරණයෙන් ඉල්ලා සිටි හෙයින් 2014.11.25 වන දින එකී ඉල්ලීමට බේරුම්කරණය විසින් අවසර දෙමින් ඇය ආදේශිත ඉල්ලුම්කාරිය ලෙස පිළිගන්නා ලදී. එකී ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයේ විරෝධතාවයක් ද නොවීය.

7. මේ අනුව බේරුම්කාර මා විසින් තීරණය කළ යුතුව ඇත්තේ, මෙම නඩුවේ යොමුවේ දක්වා ඇති පරිදි 2006.01.25 දින සිට 2006.12.02 දින දක්වා වැටුප් රහිතව මාවනැල්ල ඩිපෝ කළමණාකරු වශයෙන් සේවය කළ ඒ. පී. එච්. ජී. සී. ජයවීර මහතාගේ වැඩ තහනම් කිරීම යුක්ති සහගතද, යුක්ති සහගත නොවන්නේ නම් එම මණ්ඩලය විසින් කුමන සහනයක් හිමිවේද යන්න පිළිබඳව වේ.

8. මෙම නඩුවේ පසුබිම වී ඇත්තේ ඉල්ලුම්කාර ඒ. පී. එච්. ජී. සී. ජයවීර යන අයවලුන් 2006.01.25 දින සිට 2006.12.02 දින දක්වා කාලය තුළ වැටුප් රහිතව වැඩ තහනම් කිරීම යුක්ති සහගතද නැද්ද යන්න තීරණය කිරීමේදී පහත කරුණු පිළිබඳව බේරුම් කරණයේ අවධානය යොමු කර ඇත.

9. එනම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය පාලන අධ්‍යක්ෂක විසින් ඉල්ලුම්කරු විසින් සිදුකරන ලද අඹ ලෑලි මිලදී ගැනීමේදී සිදුවී ඇති වංචනික ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුගේ සේවය 2006.01.12 දින දරන ලිපිය මගින් 2006.01.25 දින සිට බලපැවැත්වෙන පරිදි සේවය තහනම් කර ඇත. එකී ලිපිය නඩු විභාගයේදී R1 වශයෙන් සළකුණුකොට ඇත.

10. එකී R1 දරන ලිපියේ සඳහන් පරිදි R2 දරන චෝදනා පත්‍රය ඉල්ලුම්කරුට නිකුත් කර ඇති අතර, එකී චෝදනා පත්‍රයේ චෝදනා පහක් දක්වා ඇත. එකී චෝදනාවන් අනුව ඉල්ලුම්කරුගේ සේවය R1 දරන ලිපිය මගින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුගේ සේවය තහනම් කිරීම යුක්ති සහගත බව බේරුම්කරණය තීරණය කරයි. එකී මණ්ඩලයේ ක්‍රියාත්මක X වශයෙන් ලකුණු කළ විනය ව්‍යවස්ථාවටද එය අනුකූල වේ.

11. ඉන් අනතුරුව R2 දරන චෝදනා පත්‍රය සම්බන්ධයෙන් වගඋත්තරකාර ගමනාගමන මණ්ඩලය විනය පරීක්ෂණයක් පවත්වා ඇති අතර, ඒ බව දෙපාර්ශ්වයම තම සාක්ෂි වලදී පිළිගෙන ඇත.

12. ඉන් අනතුරුව R3 දරන ලේඛනය මගින් ඉල්ලුම්කරුගේ සේවය මාස 6 කට තාවකාලිකව අත්හිටුවමින් සහ තදින් අවවාද කිරීමෙන් විනය නියෝගයක් වගඋත්තරකාර මණ්ඩලය විසින් නිකුත් කර ඇත.

13. ඉන් අනතුරුව එකී R3 දරන ලිපියේ අවසාන ඡේදය පරිදි එකී විනය නියෝගයට විරුද්ධව අභියාචනා නියෝගයක් මණ්ඩලය විසින් නිකුත් කර ඇති අතර, එකී අභියාචනය මගින් ඉහත සඳහන් මාස හයක සේවය අත්හිටුවීම මාස 3 දක්වා අඩුකර ඇත. මෙම සියළු කටයුතු සිදුකර ඇත්තේ මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවට අනුකූලව බව දෙපාර්ශ්වයම තම සාක්ෂි වලදී පිළිගෙන ඇත.

14. ඉහත පරිදි ඉහත කී විනය නියෝගයට විරුද්ධව විනය ව්‍යවස්ථා මාලාවේ ප්‍රතිපාදන පරිදි ඉල්ලුම්කරු විසින් අභියාචනයක් අභියාචන බලධරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, R5 ලෙස ලකුණු කර ඇති අභියාචන නියෝගය මගින් ඉහත කී මුල් විනය නියෝගය වන ඉල්ලුම්කරුගේ සේවය මාස 6 කට අත්හිටුවීම මාස 3 ක සේවය අත්හිටුවීම වශයෙන් සංශෝධනය කර ඇති අතර, එමගින් 2007.06.15 දින සිට 2007.09.14 දින දක්වා සේවය අත්හිටුවා ඇති අතර, 2007.09.15 වන දින මාවනැල්ල ඩිපෝවේ සේවයට වාර්තා කළ යුතු බවද දන්වා ඇත.

15. මේ අනුව ඉල්ලුම්කරුගේ සේවය නැවැත්වීම R1 මගින් 2006.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇතත්, R5 දරන අභියාචන නියෝගය මගින් මාස 3 ක සේවා කාලය තාවකාලිකව අත්හිටුවා ඇත්තේ 2007.06.15 දින සිට 2007.09.14 දින දක්වා තෙමසක කාලයක් සඳහා වුවත් එකී සේවා තහනම සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය හෝ වගඋත්තරකාර පාර්ශ්වය ඉල්ලුම්කරුගෙන් සාක්ෂි විමසා නැත.

16. වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත සැලකිරීම් වල 19 වන ඡේදය මගින් A8 ලෙස ලකුණු කර ඇති ව්‍යවස්ථාවේ උධෘතය මගින් විනය ව්‍යවස්ථාවේ 4, 6 අනුව විනය පරීක්ෂණයක් මාස 3 ක් ඇතුළත විසඳිය යුතු වුවත් එය අනිවාර්ය සාධකයක් ලෙස අර්ථ නිරූපණය කිරීම නිවැරදි නොවන බව බේරුම්කරණය පිළිගනී.

17. ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මෑතකදී විනිශ්චිත Courts Thread නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලද්දේ සේවකයකුගේ සේවය අවසන් කිරීමට සේවා යෝජකට අයිතිය ඇතත් සේවකයාට හිමි වැඩ තහනම් කළ කාලයේ වැටුප ඔහුට අහිමි නොකළ යුතු බවය.

18. මෙම නෛතික තත්ත්වයන් තුළ මෙම නඩුවේ කාර්මික ආරවුල වන ඉල්ලුම්කරු 2006.01.01 සිට 2006.12.02 දින දක්වා වැඩ තහනම් කිරීම ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව යුක්ති සහගත වුවත් R5 දරන ලේඛනය මගින් R3 දරන මාස 6 කට තාවකාලික සේවය අත්හිටුවීම R4, R5 දරන ලේඛන මගින් අභියාචනයේදී

විනය නියෝගයේ දඬුවම් මාස 6 සිට 3 දක්වා අඩු කර ඇතත්, එහි ප්‍රතිලාභය වන මාස 7 යි දින 7ක වැටුප ඉල්ලුම්කරුට ලබා නොදීම, අයුක්ති සහගත බවට බේරුම්කරු වන මම තීරණය කරමි. මෙහිදී ඉල්ලුම්කාර පාර්ශ්වය ''ඒ 8'' වශයෙන් නඩු විභාගයේ දී ලකුණු කළ නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස්ගේ ලිපියටද බේරුම්කරණයේ අවධානය යොමු වූ බව සඳහන් කරමි.

19. ඒ අනුව වැඩ තහනමේ සිටි කාලය වන මාස 10 දින 07 ක කාලයෙන් මාස 3 ක කාලය අඩු කළ පසු ඉතිරි කාලය සඳහා වැටුප ඉල්ලුම්කරුට හිමි බවට මෙයින් තීරණය කරමි.

20. ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරන අවස්ථාවේ වැටුප රු.13,080/- ක් බවට සාක්ෂි වලදී වගඋත්තරකාර මණ්ඩලය පිළිගෙන ඇති බැවින් ඉහත කී මාස 10 දින 7 ක කාලයෙන් ඉහත කී මාස 3 ක කාලය අඩු කළ පසු ඉතිරි කාලය වන මාස 7 යි දින 7 ක කාලය සඳහා රු.13,080X7=91,560+3,052 රුපියල් අනූහතර දහස් හයසිය දොළහ (රු.94,612/-) ක මුදලක් මෙම නියෝගය හා ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත කෑගල්ල සහකාර කම්කරු කොමසාරිස් ඉදිරියේ තැන්පත් කළ යුතු බවට වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

21. එසේ තැන්පත් කළ පසු එකී මුදල මෙම නඩුවේ ආදේශිත ඉල්ලුම්කාරියට ලබාගත හැකි බවටද, වැඩිදුරටත් මෙයින් නියෝග කරමි.

22. මෙය සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් හා ප්‍රදානයක් කොට මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2016 ක් වූ මාර්තු මස 16 වැනි දින කොළඹ දී ය.

05 - 785

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.